ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2044/27 – 2017 නොවැම්බර් 08 වැනි බදාදා – 2017.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

64(2) වන වගන්තිය යටතේ පුරප්පාඩුවක් පිරවීම

අංක 07 - ගාල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත්කර ගන්නා ලද ගීතා සමන්මලි කුමාරසිංහ මහත්මිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු 91(1) ඇ(xiii) ව්‍යවස්ථාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක වශයෙන් තෝරාපත්කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ ඡන්දය දීමට හෝ සුදුස්සකු නොවන බවට, අභියාචනාධිකරණයේ අංක CA 362/2015 දරන රිට් අයදුම්පත්‍රය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් ගනු ලැබූ තීරණය, අභියෝගයට ලක් කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අභියාචන පෙත්සම සළකා බැලීමෙන් අනතුරුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක S. C. Appeal No. 99/2017 යටතේ, අභියාචනාධිකරණය විසින් කරන ලද තීරණය, ස්ථිර කරමින්, අභියාචන පෙත්සම නිෂ්ප්‍රභ කරනු ලැබ ඇති හෙයින්, අටවැනි පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයක පුරප්පාඩුවක් ඇතිවී තිබෙන බව, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(1) වන වගන්තිය යටතේ, පාර්ලිමේන්තු මහලේකම්වරයා විසින්, මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි මෙම පුරප්පාඩුව පුරවන ලෙස එකී මන්ත්‍රීවරයා තෝරාපත්කර ගන්නා ලද මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ඉහත කී පනතේ 64(1) වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබූ හෙයින් ද,

තේරීම්භාර නිලධරයා විසින් එකී පනතේ 64(2) වන වගන්තිය යටතේ ක්‍රියාකරමින් එකී මැතිවරණ කොට්ඨාසය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ඉහල මැදගම ගමගේ පියසේන මහතා තෝරාපත් කරන ලද බව ප්‍රකාශයට පත්කර, එම පනතේ පළමුවන උපලේඛනයේ ''ක'' ආකෘතිය මත, මැතිවරණ කොමිෂන් සභාවට වාර්තාව ඉදිරිපත් කොට ඇති හෙයින් ද,

1A – G26564 – 382 (2017/11)

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එකී පනතේ 64(2) වන වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඉහත කී, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම පිණිස අංක 07 - ගාල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා අටවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස ඉහල මැදගම ගමගේ පියසේන මහතා තෝරාපත් කර ගන්නා ලද බව, මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**මහින්ද දේශප්‍රිය,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එන්. ජේ. අබේසේකර,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**එස්. රත්නජීවන් එච්. හූල්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2017 නොවැම්බර් මස 08 වන දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

11-1054

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.